NEDA

The National Chamber of Commerce of Sri Lanka

# ව්‍යවසායකත්ව සම්මාන 2025

# බස්නාහිර පළාත

## බස්නාහිර පළාතේ හොඳම ව්‍යවසායකයින් ඇගයීම

# ව්‍යවසායකත්ව සම්මාන 2025

# බස්නාහිර පළාත

***බස්නාහිර පළාතේ හොඳම ව්‍යවසායකයින් ඇගයීම***

සංවිධානය

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA)

සමග

ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය (NCCSL)

## ව්‍යවසායකත්ව සම්මාන

බස්නාහිර පළාත් ව්‍යවසායකයන් වෙනුවෙන් “**ව්‍යවසායකත්ව සම්මාන 2025 - බස්නාහිර පළාත**” සම්මාන ප්‍රදානෝත්සවය, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) **හා** ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය (NCCSL) සහයෝගයෙන් යුතුව අටවන වරටත් සංවිධානය කරනු ලබයි.

ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය දීර්ඝ කාලයක් තිස්සේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධනය සඳහා දායකත්වය දක්වන ආයතනයකි. පුහුණු වැඩසටහන් / වැඩමුළු, මානව සම්පත් සංවර්ධනය, විද්‍යුත් වාණිජ වැඩසටහන් ආදී නිපුණතා සංවර්ධනය උදෙසා වූ වැඩසටහන් රාශියක් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල නියුතු ව්‍යවසායකයින් සඳහා පවත්වනු ලබන අතර විශේෂයෙන් **විශේෂ අවශ්‍යතාවලින් යුත්** (differently able) ව්‍යවසායකයින් පිළිබඳව ද මෙහිදී විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) හා ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය සහයෝගයෙන් යුතුව සංවිධානය කරනු ලබන මෙම සම්මාන ප්‍රදානෝත්සවයද බස්නාහිර පළාත් ක්ෂුද්‍ර, සුළු, මධ්‍යම හා විශාල පරිමාණ ව්‍යවසායකයන් වෙනුවෙන් සිදු කරනු ලබන තවත් එක් සේවාවක් ලෙස හැඳින්විය හැකිය.

මෙම සම්මාන ප්‍රදානෝත්සවයේ දී සම්මාන 27ක් සහ කුසලතා සහතික පත්‍ර අධික සංඛ්‍යාවක් මෙහිදී පිරිනැමීමට නියමිතව ඇත.

## මෙම සම්මාන උළෙලෙහි අරමුණු

- බස්නාහිර පළාත තුළ ව්‍යවසායකයන් හඳුනාගැනීම හා ඔවුන් පිළිගැනීමට ලක් කිරීම
- බස්නාහිර පළාත සහ රටේ ආර්ථික සංවර්ධනය උදෙසා තම දායකත්වය වැඩි දියුණු කිරීම සඳහා ව්‍යවසායකයින් දිරි ගැන්වීම හා උනන්දු කරවීම
- සිය ව්‍යාපාරික ක්ෂේත්‍රය තුළ විශිෂ්ටත්වය ලබාගැනීමට ව්‍යවසායකයින් දිරිමත් කිරීම

## සම්මාන ප්‍රදානය කරන ප්‍රධාන අංශ

- කර්මාන්ත / නිෂ්පාදන අංශය
- කෘෂිකර්මය / පශු සම්පත් සහ ධීවර අංශය
- සේවා අංශය (සත්කාරක සේවා / සංචාරක / වෙනත් සේවා)

## කර්මාන්තයේ පරිමාණය

| පරිමාණය | ආර්ථික අංශය | පූර්ණ කාලීන සේවා නියුක්තිකයන් සංඛ්‍යාව | වාර්ෂික පිරිවැටුම - රුපියල් |
|---|---|---|---|
| ක්ෂුද්‍ර | **කර්මාන්ත අංශය** | 10 ට අඩු | මිලියන 20 ට අඩු |
| | **සේවා අංශය** | 05 ට අඩු | |
| සුළු | **කර්මාන්ත අංශය** | 10 – 50 දක්වා | මිලියන 21 - 350 දක්වා |
| | **සේවා අංශය** | 05 – 50 දක්වා | |
| මධ්‍යම | **කර්මාන්ත අංශය** | 51 – 200 දක්වා | මිලියන 351 - 1000 දක්වා |
| | **සේවා අංශය** | | |
| විශාල පරිමාණ | **කර්මාන්ත අංශය** | 201 ට වැඩි | මිලියන 1000 වැඩි |
| | **සේවා අංශය** | | |

## ප්‍රදානය කරනු ලබන සම්මාන

- 2025 වසරේ බස්නාහිර පළාතේ හොඳම ව්‍යවසායකයා සම්මානය (රන්, රිදී, ලෝකඩ සම්මාන)

මෙය මෙම සම්මාන ප්‍රදානෝත්සවයේ වඩාත් වැදගත් මෙන්ම කීර්තිමත්ම සම්මානය යි. 2024/25 වර්ෂයේ **පළාත තුළ වඩාත්ම කැපී පෙනෙන විශිෂ්ඨතම ව්‍යවසායකයා** මෙහිදී හඳුනාගනු ලබයි.

- ව්‍යාපාර පරිමාණ සහ ව්‍යාපාර අංශ ඔස්සේ හොඳම ව්‍යවසායකයා සම්මාන (සම්මාන **12**ක් සහ කුසලතා සහතික පත්‍ර)

මෙම සම්මාන ප්‍රදානෝත්සවයේ ව්‍යාපාර අංශ සඳහා පිරිනමන ප්‍රධාන සම්මාන වෙයි. ව්‍යාපාර පරිමාණ 04 යටතේ සම්මාන සඳහා වූ *කර්මාන්ත/නිෂ්පාදන අංශය; *කෘෂිකර්මාන්ත, පශු සම්පත් සහ ධීවර අංශය; සහ *සේවා අංශය (සත්කාරක සේවා / සංචාරක / වෙනත් සේවා) යන අංශ 03 සඳහා සම්මාන ප්‍රදානය කරනු ලැබේ.

| සම්මාන සංඛ්‍යාව | කර්මාන්ත අංශය | සම්මානය |
|---|---|---|
| කර්මාන්ත / නිෂ්පාදන අංශය | | |
| 01 | ක්ෂුද්‍ර | හොඳම ව්‍යවසායකයා සම්මානය |
| 01 | සුළු | හොඳම ව්‍යවසායකයා සම්මානය |
| 01 | මධ්‍යම | හොඳම ව්‍යවසායකයා සම්මානය |
| 01 | විශාල පරිමාණ | හොඳම ව්‍යවසායකයා සම්මානය |
| කෘෂිකර්මය, පශු සම්පත් සහ ධීවර අංශය | | |
| 01 | ක්ෂුද්‍ර | හොඳම ව්‍යවසායකයා සම්මානය |
| 01 | සුළු | හොඳම ව්‍යවසායකයා සම්මානය |
| 01 | මධ්‍යම | හොඳම ව්‍යවසායකයා සම්මානය |
| 01 | විශාල පරිමාණ | හොඳම ව්‍යවසායකයා සම්මානය |
| සේවා අංශය (සත්කාරක සේවා /සංචාරක සේවා / වෙනත් සේවා) | | |
| 01 | ක්ෂුද්‍ර | හොඳම ව්‍යවසායකයා සම්මානය |
| 01 | සුළු | හොඳම ව්‍යවසායකයා සම්මානය |
| 01 | මධ්‍යම | හොඳම ව්‍යවසායකයා සම්මානය |
| 01 | විශාල පරිමාණ | හොඳම ව්‍යවසායකයා සම්මානය |
| **12** | **එකතුව** | |

- **විශේෂ සම්මාන (සම්මාන 12)**

පහත සඳහන් විශේෂ නිර්ණායක / තේමා ක්ෂේත්‍ර යටතේ හොඳම කාර්ය සාධනය සඳහා සම්මාන 12 ක් පිරිනමනු ලැබේ

1. හොඳම පරිසර හිතකාමී ව්‍යවසායකයා සඳහා සම්මානය
2. හොඳම අපනයනකරු සඳහා සම්මානය
3. හොඳම ඵලදායී ව්‍යවසායකයා සඳහා සම්මානය
4. හොඳම නව්‍ය ව්‍යවසායකයා සඳහා සම්මානය
5. හොඳම අගය එකතුකළ ව්‍යවසායකයා සඳහා සම්මානය
6. හොඳම බලශක්ති කාර්යක්ෂමතාවයෙන් යුත් ව්‍යවසායකයා සඳහා සම්මානය
7. හොඳම තරුණ ව්‍යවසායකයා සඳහා සම්මානය (වයස අවු. 18ත් 35ත් අතර)
8. හොඳම කාන්තා ව්‍යවසායකයා සඳහා සම්මානය
9. විශේෂ අවශ්‍යතාවලින් යුත් හොඳම ව්‍යවසායකයා සඳහා සම්මානය
10. කාන්තාවන් සඳහා වැඩිපුරම රැකියා අවස්ථා සපයන හොඳම ව්‍යවසායකයා
11. තිරසාර ව්‍යාපාරික භාවිතයන් සහිත ව්‍යාපාර ව්‍යවසාය සඳහා සම්මානය
12. මූල්‍ය කාර්ය සාධනය අතින් ශක්තිමත් හොඳම ව්‍යවසායකයා සඳහා වන සම්මානය

## සම්මාන සඳහා සුදුසුකම්

මෙම සම්මාන සඳහා සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය

- අදාළ ව්‍යාපාරය බස්නාහිර පළාත තුළ පිහිටා තිබිය යුතුය. (ජාතික මට්ටමේ ව්‍යාපාර සංවිධානවල ශාඛාවක් නොවිය යුතුය)
- ක්ෂුද්‍ර, සුළු, මධ්‍යම හා විශාල පරිමාණ යන කර්මාන්ත අංශයන්ට අයත් ව්‍යාපාරයක් විය යුතුය.
- ඉල්ලුම් කරන අවස්ථාවේ සෑම අයදුම්කරුවෙක්ම සතුව වලංගු ව්‍යාපාර ලියාපදිංචි සහතිකයක් (BRC) තිබිය යුතුය.

## තෝරාගැනීමේ ක්‍රමවේදය

සියලු අයදුම්පත් පැහැදිලිව සහ විනිවිද පෙනෙන නිර්ණායක අනුව ඇගයීමට ලක් කරනු ලබන අතර, බහුවිධ විශේෂඥ දැනුම ඇති විනිශ්චය මණ්ඩලයක් විසින් සමාලෝචනය කරනු ඇත. ජයග්‍රාහකයින් පියවර 3ක් යටතේ නිර්ණය කිරීමට නියමිතව ඇත.

1. මූලික නිරීක්ෂණය හා කෙටි ලැයිස්තුගත කිරීම
2. සම්මුඛ සාකච්ඡා
3. ක්ෂේත්‍ර චාරිකා (අවශ්‍යනම්)

## තෝරාගැනීමේ නිර්ණායක (ලකුණු දීමේ පටිපාටිය)

| # | **තෝරාගැනීමේ නිර්ණායකය** | ලකුණු |
|---|---|---|
| i | නායකත්වය සහ උපාය මාර්ගය | 10 |
| ii | නවීනත්වය / තාක්ෂණය | 10 |
| iii | ගෝලීය සහ දේශීය වෙළඳපොළ කරා ළඟාවීම | 10 |
| iv | වෙළඳපොළ කොටස / විකුණුම් කාර්යක්ෂමතාවය | 10 |
| v | රැකියා උත්පාදනය | 10 |
| vi | ඵලදායිතාවය | 15 |
| vii | ආයතනික සමාජ වගකීම් | 10 |
| viii | බලශක්ති කාර්යක්ෂමතාවය සහ පරිසර හිතකාමීත්වය | 10 |
| ix | මූල්‍ය කාර්ය සාධනය හා ව්‍යාපාර ඉලක්ක | 15 |
| | **එකතුව** | **100** |

## විනිශ්චය මණ්ඩලය

අයදුම්පත් හොඳින් සමාලෝචනය කිරීමෙන් සහ ක්ෂේත්‍ර සත්‍යාපනයේ ප්‍රතිඵලවලින් පසුව සම්මානලාභීන්ගේ අවසාන තේරීම සිදු කරනු ලබන ප්‍රවීණ විනිසුරු මඩුල්ලක් විසින් අයදුම්පත ඇගයීමට ලක් කරනු ලැබේ.

විනිශ්චය මණ්ඩලය පහත සඳහන් ආයතනවල නියෝජිතයන්ගෙන් සමන්විත වේ.

- ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA)
- බැංකු
- රාජ්‍ය ආයතන
- පුද්ගලික අංශය

## ජයග්‍රාහකයන්හට හිමිවන ප්‍රතිලාභ

ජයග්‍රාහකයන්හට පහත ප්‍රතිලාභ හිමිවනු ඇත,

- පළාත් හා ජාතික මට්ටමේ ඇගයීමක්/පිළිගැනීමක්
- මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය හරහා පළාත් සහ ජාතික මට්ටමෙන් ප්‍රචාරයක්
- ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA), ජාතික වාණිජ මණ්ඩලය සහ අනෙකුත් ආයතන හරහා ලැබෙන පිළිගැනීම මත ඔවුන්ගේ ව්‍යාපාර දියුණු කරගැනීමට මෙන්ම ඉහළ ප්‍රචාරණයක් ලබා ගැනීමට අවස්ථාව

## අයදුම්පත් භාරදීම

සම්පූර්ණ කරන ලද අයදුම්පත්, අයදුම්පත් භාරදීමේ ගාස්තු ද සමග මහ ලේකම් / ප්‍රධාන විධායක නිලධාරී, ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය, පළමු මහල, ජාතික වාණිජ මණ්ඩල ගොඩනැගිල්ල, නො. 450, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10 යන ලිපිනයට 2025 සැප්තැම්බර් මස 18 වන බ්‍රහස්පතින්දා දින ප.ව. 4.00 ට පෙර ගෙනවිත් භාරදිය යුතුය.

| කර්මාන්ත අංශය | රුපියල් |
|---|---:|
| ක්ෂුද්‍ර | 1,500/- |
| සුළු | 3,000/- |
| මධ්‍යම | 8,000/- |
| විශාල පරිමාණ | 15,000/- |

අයදුම්පත් භාරදෙන අවස්ථාවේදී, භාරදීමේ ගාස්තු, මුදල් හෝ චෙක් පතක් මගින් ගෙවිය හැකිය. අවසාන අයදුම්පත ඉදිරිපත් කළ පසු, පසුව අයදුම්පත ඉල්ලා අස්කර ගත්තද භාරදීමේ ගාස්තුව ආපසු ලබා නොදෙන බවට කරුණාවෙන් සලකන්න.

චෙක්පත් "**ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය**" නමට ලිවිය යුතුය. අපගේ බැංකු ගිණුම් විස්තර පහත පරිදි වේ.

| | |
|---|---|
| **ගිණුමේ නම** | : ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය |
| **බැංකුව** | : ලංකා බැංකුව නගර ශාඛාව |
| **බැංකු ගිණුම් අංකය** | : 350940 |

තැන්පතු පත්‍රිකාවේ / මාර්ගගත හුවමාරු පත්‍රිකාවේ ස්කෑන් කළ පිටපත nishanthi@nationalchamber.lk වෙත විද්‍යුත් තැපෑලෙන් එවන්න.

## සම්මාන ප්‍රදානෝත්සවය

"ව්‍යවසායකත්ව සම්මාන 2025 - බස්නාහිර පළාත" සම්මාන උළෙල 2025 නොවැම්බර් මස 19 වන බදාදා දින BMICH හිදී බස්නාහිර පළාතේ රාජ්‍ය ආයතන සහ ව්‍යාපාරික ප්‍රජාවගේ සහභාගිත්වයෙන් පැවැත්වීමට නියමිතය.

## අප අමතන්න

- වැඩිදුර තොරතුරු සඳහා ජාතික වාණිජ මණ්ඩලය හා සම්බන්ධ වන්න**:**

| | |
|---|---|
| **සම්බන්ධීකරණ නිලධාරීනීන්** | : නිශාන්ති දිල්රුක්ෂි / හංසි ජයවර්ධන / නෙත්මි සිල්වා |
| **දුරකථන** | : 011 4741788, 011 2689600, 076 2 555 707, 077 3678728 |
| **විද්‍යුත් ලිපිනය** | : nishanthi@nationalchamber.lk; hansi@nationalchamber.lk services@nationalchamber.lk |
| **වෙබ් අඩවිය** | : www.nationalchamber.lk |
| සමාජ මාධ්‍ය වෙබ් පිටු | : www.facebook.com/nationalchamber/ https://lk.linkedin.com/company/nccsl |

N E D A

The National Chamber of Commerce of Sri Lanka